# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss - 2022)

(6 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# චිත්‍ර කලාව

## 6 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| පළමුවන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
| 1.0 චිත්‍ර සංරචනය | 1.1 පරිසරය ඇසුරෙන් රේඛා චිත්‍ර අඳියි. | • ගස්වල විවිධත්වය, විසිතුරු බව, පිළිබඳ ව අදහස් දක්වයි.<br>• ගස්වල කඳ, අතු, රිකිලිවල රිද්මය ශාක පත්‍රවල දක්නට ඇති රටා පිළිබඳ දැනුවත් ව කටයුතු කරයි.<br>• තෝරාගත් ගස් කිහිපයක් රේඛාවෙන් අධ්‍යයනය කරයි.<br>• රේඛාකරණයේ දී පැන්සල මගින් අඳුර, එළිය පෙන්වීමේ ක්‍රමවේද අත්හදා බලා ක්‍රියාවට නංවයි. | • රේඛා චිත්‍ර<br>- පරිසරය අධ්‍යයනය<br>- ගස්වල විවිධත්වය<br>- ශාක පත්‍ර<br>- බඳ<br>- අතුරිකිලි<br>- ත්‍රිමාණ ලක්ෂණ<br>- සමබරතාව<br>• රේඛාවේ ගති ලක්ෂණ | 1.1.1 අපේ පාසල් වත්ත | 02 |
| | | • සත්ත්ව ඉරියවු ඇඳීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• තෝරාගත් සතුන් රේඛාවෙන් අධ්‍යයනය කරයි.<br>• රේඛාකරණයේ දී පැන්සල මගින් එළිය-අඳුර පෙන්වීමේ ක්‍රමවේද අත්හදා බලා ක්‍රියාවට නංවයි.<br>• | • රේඛා චිත්‍ර<br>- සත්ත්ව ඉරියවු<br>- පරිමාණය<br>- ත්‍රිමාණ ලක්ෂණ<br>- සමබරතාව<br>• රේඛාවේ ගති ලක්ෂණ | 1.1.2 නිතර දකින සතුන් රේඛාවෙන් අඳිමු | 02 |
| 2.0 ද්‍රව්‍ය බලා ඇඳීම | 2.1 සරල ජ්‍යාමිතික හැඩගත් වස්තු රේඛාවෙන් අඳියි. | • සරල ජ්‍යාමිතික හැඩ පැන්සලෙන් ඇඳ වර්ණ කරයි.<br>• රේඛාවේ විවිධ ගති ලක්ෂණ එළිය-අඳුර ත්‍රිමාණ ලක්ෂණ භාවිත කරයි, | • ජ්‍යාමිතික වස්තු<br>- ගෝලය<br>• රේඛා අධ්‍යයනය<br>- රේඛාවේ විවිධතා<br>• ත්‍රිමාණ ලක්ෂණ<br>• එළිය හා අඳුර | 2.1.1 ගෝලාකාර වස්තුන්ගේ හැඩ රේඛාවෙන් අඳිමු | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3.0 මෝස්තර නිර්මාණය | 3.1 මූලික වර්ණ භාවිතයෙන් සැරසිලි නිර්මාණය කරයි. | • මූලික වර්ණ භාවිත කරයි.<br>• සරල ජ්‍යාමිතික හැඩ හා ස්වභාවික හැඩ ඇඳ වර්ණ ගන්වයි. | • මූලික වර්ණ<br>• විවිධ සැරසිලි<br>• ස්වභාවික හැඩ<br>• ජ්‍යාමිතික හැඩ<br>- වෘත්තය<br>- සමචතුරස්‍රය<br>- ත්‍රිකෝණය<br>- ඍජුකෝණාස්‍රය | 3.1.1 නිල්,කහ,රතු යොදමු, අලුත් රටා මවමු | 02 |
| 4.0 ග්‍රැෆික් නිර්මාණය | 4.1 ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා අච්චු මුද්‍රණ ක්‍රමය භාවිත කරයි. | • ළමා පොත් පිටකවරයක් සැලසුම් කරයි.<br>• සරල රූප හා අක්ෂර සමබරව ගලපයි.<br>• සරල අච්චු මුද්‍රණ ක්‍රමය භාවිත කර මුද්‍රණ පිටපත් ලබා ගනියි.<br>• සන්නිවේදන අවශ්‍යතා සඳහා නවතාවයෙන් පිටකවර නිර්මාණය කරයි. | • අවශ්‍යතාව<br>• සැලසුම්<br>• ගැලපීම<br>• සමබරතාව<br>• වර්ණ මාධ්‍ය<br>• මුද්‍රණය සඳහා සුදුසු බව<br>• සරල මුද්‍රණ ශිල්ප ක්‍රම<br>- අච්චු මුද්‍රණ ක්‍රමය | 4.1.1 ළමා පොත් පිටකවරයක් නිර්මාණය කරමු | 01 |
| 5.0 මූර්ති නිර්මාණය | 5.1 ඇඹීමේ හා එකලස් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයෙන් මූර්ති නිර්මාණය කරයි. | • මැටි මාධ්‍ය භාවිතය සහ පදම් කිරීම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>• මැටි මාධ්‍යයෙන් සරල ජ්‍යාමිතික හැඩ නිර්මාණය කරයි.<br>• උපකරණ විධිමත් ව භාවිත කරයි.<br>• ජ්‍යාමිතික හැඩ එකතුවෙන් මූර්ති සම්පිණ්ඩනයක් කරයි.<br>• ඇඹීමේ ශිල්ප ක්‍රමය භාවිතයට ගනියි. | • ඇඹීමේ ශිල්ප ක්‍රමය<br>• සරල හැඩ ඇඹීම<br>• මැටි මාධ්‍ය හා ශිල්ප ක්‍රම<br>• නිර්මාණාත්මකබව<br>• සමබරතාව | 5.1.1 ජ්‍යාමිතික හැඩ හදමු | 01 |
| 6.0 නිර්මාණ රසවින්ද නය | 6.1 තෝරා ගත් ආගමික හා ජාතික උත්සව අවස්ථාවන්හි දක්නට ලැබෙන කලාත්මක අංග රසාස්වාදය කරයි. | • විවිධ ආගමික උත්සව අවස්ථාවල මූලික ලක්ෂණ විස්තර කරයි.<br>• විවිධ ආගමික උත්සව අංග සඳහා බලපෑ විවිධ ආභාස හා සුවිශේෂ අනන්‍යතා විස්තර කරයි. | • බෞද්ධ<br>- වෙසක් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග | 6.1.1 වෙසක් උත්සවය ආශ්‍රිත කලා අංග රසවිඳිමු | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7.0 කලා ඉතිහාසය | 7.1 විවිධ ආගමික බලපෑම් ඇසුරෙන් සම්භවය වූ කලා අංග අධ්‍යයනය කරයි. | • බෞද්ධ ස්තූප වර්ග කරයි.<br>• ස්තූපවලට අයත් හැඩ විස්තර කරයි.<br>• ස්තූප මූලිකාංගවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි. | • ස්තූප වර්ග<br>• ස්තූප හැඩ<br>• ස්තූප මූලික අංග<br>• කලාත්මක ලක්ෂණ | 7.1.1 බෞද්ධ ස්තූපයක මූලිකාංග හා ස්තූප වර්ග හඳුනා ගනිමු | 01 |
| | 7.2 දේශීය සම්ප්‍රදායික සැරසිලි නිර්මාණ අධ්‍යයනය කරයි. | • දේශීය සම්ප්‍රදායික සැරසිලි මෝස්තරවල විශේෂතා හඳුනා ගෙන ඇඳ වර්ග කරයි. | • අභ්‍යාසකරණය<br>- යටිපෝරුව<br>- වක දෙක<br>- ලියපත<br>- තිරිඟි තලය<br>• සැරසිලි මූලිකාංග වර්ගීකරණය<br>- දිව්‍ය<br>- සත්ත්ව<br>- උද්භිත<br>- නිර්ජීවී<br>• නිර්ජීවී සැරසිලි<br>- අරිම්බුව<br>- ගල් බිංදුව<br>- කුන්දිරික්කන්<br>- පනාව<br>- තනිපොට ලණුව<br>- දෙපට ලණුව | 7.2.2 සිංහල සැරසිලි නිර්මාණකරණයේ පදනම උගෙනිමු | 01 |
| | - | | | **පළමු වන වාරය කාලච්ඡේද එකතුව** | 13 |